# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2294/73 - 2022 අගෝස්තු මස 27 වැනි සෙනසුරාදා - 2022.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි අධිකාරය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/PAN/04/04/02/40.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/2/2017/CEB/325.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලිප්පත්තු බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 736 බැද්දේගම ග්‍රාම නිලධාරි වසමේ බැද්දේගම ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි. මහ 7071 දරන 2021.11.27 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් කැබලි අංක, නම් හා සතර මායිම් වලින් සමන්විත ඉඩම්:

**01. කැබලි අංකය 1 - ඉඩමේ නම: පල්ලේහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: මුල් හිමිකම්පාන්නා සොයාගත නොහැකිය; ප්‍රමාණය: හෙක්. 0.0126.**

සතර මායිම්-
*උතුරට*: හිමිකරු නොදන්නා පල්ලෙහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක; *නැගෙනහිරට*: එම්. ටී. ජී. ධනපාල හිමිකම් කියන පල්ලෙහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක; *දකුණට*: කැබලි අංක 2; *බටහිරට*: එම්. ටී. ජී. ධනපාල හිමිකම් කියන පල්ලෙහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක.

**02. කැබලි අංකය 2 - ඉඩමේ නම: පල්ලේහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: මුල් හිමිකම්පාන්නා සොයාගත නොහැකිය; ප්‍රමාණය: හෙක්. 0.0414.**

සතර මායිම්-
*උතුරට*: කැබලි අංක 1; *නැගෙනහිරට*: හිමිකරු නොදන්නා පල්ලෙහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක; *දකුණට*: කැබලි අංක 3; *බටහිරට*: හිමිකරු නොදන්නා පල්ලෙහේවානිලේ කුඹුර හෙවත් දුරනිලේ කුඹුර ගලේබොක්ක.

**03. කැබලි අංකය 3 - ඉඩමේ නම: ගලේබොක්ක පල්ලේහේවානිලේ කුඹුර හෙවත් කුඹුරේගෙදර යායේ කුඹුර; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඩී. එල්. චන්ද්‍රදාස, අංක 95, 10 කණුව, මල්පාන, කෙන්ගල්ල; ප්‍රමාණය: හෙක්. 0.0760.**

සතර මායිම්-
*උතුරට*: කැබලි අංක 2; *නැගෙනහිරට*: ඩී. එල්. චන්ද්‍රදාස හිමිකම් කියන ගලේබොක්ක පල්ලේහේවානිලේ කුඹුර හෙවත් කුඹුරේගෙදරයායේ කුඹුර; *දකුණට*: මූ.පි. මහ 2731හි කැබලි අංක 163 හා 164; *බටහිරට*: ඩී. එල්. චන්ද්‍රදාස හිමිකම් කියන ගලේබොක්ක පල්ලේහේවානිලේ කුඹුර හෙවත් කුඹුරේගෙදරයායේ කුඹුර.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්

හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 14 වැනි දින ප.ව. 2.00ට පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022 නොවැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

නිරංජන් ශ්‍රීමන්ත සේනාධීර,
ප්‍රාදේශීය ලේකම්,
පන්විල කොට්ඨාසය.

2022 අගෝස්තු මස 15 වැනි දින,
පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0273

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.